# දේශීය පොල්තෙල් නිෂ්පාදකයින් සඳහා වන මාර්ගෝපදේශ

1. අයදුම්කරුවන් පොල් සංවර්ධන අධිකාරිය සහ කර්මාන්ත අමාත්‍යාංශය තුළ අදාල වර්ෂය සඳහා ලියාපදිංචි වූ ආයතන විය යුතුය.

2. ඉහත ආයතනවල ලියාපදිංචිය අනුව කර්මාන්තශාලාවෙහි නිෂ්පාදන ධාරිතාව, ගබඩා පහසුකම් සහ කාරක ප්‍රාග්ධනය පදනම් කරගෙන අමුද්‍රව්‍ය ලබාදීමේ ප්‍රමාණය තීරණය කරනු ලබයි.

3. ආනයනය කරනලද අමුද්‍රව්‍ය ප්‍රමාණයෙන්, ප්‍රතිශතයක් කර්මාන්තයේ නිෂ්පාදන ධාරිතාව අනුව නිකුත් කරනු ලැබේ.

4. ආනයනය කරන ලද අමුද්‍රව්‍ය අඩංගු බහාලුම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාල සහතිකකරණ යටතේ කර්මාන්තකරුවන් විසින් ආරක්ෂිතව ගබඩා පහසුකම් ඇති ස්ථාන වෙත ප්‍රවාහනය කල යුතුය.

5. පරීක්ෂණ කටයුතු පොල් සංවර්ධන අධිකාරිය, පොල් පරීක්ෂණ ආයතනය, කාර්මික සංවර්ධන මණ්ඩලය, ජාතික ශාක නිරෝධායන සේවා ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ආහාර සුරක්ෂිත අංශය විසින් කරනු ලබන අතර එහි ගාස්තු අනයනකරු විසින් දැරිය යුතු වේ.

6. අමුද්‍රව්‍ය රේගුවෙන් සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන්, බී සී සී ලංකා ආයතනය විසින් නිදහස් කල පසු කර්මාන්තශාලා සඳහා ප්‍රවාහන වියදම එම කර්මාන්තකරුවන් විසින් දැරිය යුතු වේ. මෙය සමස්ත ලංකා පාරම්පරික පොල්තෙල් නිෂ්පාදකරුවන්ගේ සංගමය විසින් පොල් සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ සම්බන්ධීකරණය කරනු ලැබේ.

7. මෙම අමුද්‍රව්‍ය ලබාගන්නා සියලු නිෂ්පාදන ආයතන වසරක කාලයක් තුල ප්‍රමිති සහතික ලබාගැනීම අනිවාර්ය වනු ඇත.

8. සියලුම කර්මාන්තකරුවන් විසින් තමා විසින් ලබාගන්නා අමුද්‍රව්‍ය, නිෂ්පාදනය කල පොල්තෙල්, පුන්නක්කු, තම නිෂ්පාදන විකුණූ ආයතන සහ ධාරිතාව පැහැදිලිව ලේඛන ගත කලයුතු අතර ඒවා දෛනිකව පොල් සංවර්ධන අධිකාරිය දැනුවත් කල යුතු වේ.

   මෙම කර්මාන්තකරුවන් විසින් සහතික කරන ලද ලේඛන පොල් සංවර්ධන අධිකාරිය හෝ බලයලත් පරීක්ෂණ ආයතනවල නිලධාරීන්ට විමර්ශනය කිරීමට පහසුකම් ලබා දිය යුතුය.

9. රජය විසින් ලබාදෙන අමුද්‍රව්‍ය ලබා ගන්නා කර්මන්තශාලාවල අනෙකුත් අදේශික/ ආනයනයනික තෙල් ගබඩා කිරීම හෝ නිෂ්පාදනය නොකළ යුතු බවට සහතික විය යුතුය.

   මෙම අමුද්‍රව්‍ය පොල්තෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ අදේශික තෙල් අනයනික කරුවන්ට හෝ එම අනුබද්ධ ආයතනවලට ලබාගත නොහැකි වේ.

10. මෙම අමුද්‍රව්‍ය ආනයනය කිරීම බී සී සී ලංකා ආයතනය මගින් පමණක් ක්‍රියාත්මක කරන අතර අමුද්‍රව්‍ය ආනයන සඳහා අවශ්‍ය සියලුම ගෙවීම් බැංකු කළමනාකාර ඇනවුම් චෙක්පත් (Bank Pay Order) මගින් බී සී සී ලංකා ආයතනයට ලබා දිය යුතුය.

11. බී සී සී ලංකා ආයතනය විසින් අවසාන ඇනවුම් බාරගන්නා අවස්ථාවේදී කර්මාන්තකරුවන් විසින් මිලදී ගන්නා අමුද්‍රව්‍යවල වටිනාකමට සාපේක්ෂව 20%ක බැංකු ඇපකරයක් බීසීසී ලංකා ආයතනය වෙතට ලබාදිය යුතුය.

12. අමුද්‍රව්‍ය ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලැබීමට දිනදෙකකට පෙර එකහවූ සම්පූර්ණ මුදල බී සී සී ලංකා ආයතනයට ලබාදිය යුතුය.